දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) MH/AD/01/09/Add.Se.(MS)/2024
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2024. 10. 15
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක: 02-140/2024

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් - ජාතික රෝහල (කොළඹ, මහනුවර, කරාපිටිය)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
ජේෂ්ඨ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රෝහල් හා ආයතන ප්‍රධානීන්.

## අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) තනතුර
## සෞඛ්‍ය අමාත්‍යාංශය

01. සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2024.08.26 දිනට පුරප්පාඩු වී ඇති අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සක්‍රිය සේවයේ නියුතු ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ගෙන් සහ එම ශ්‍රේණිවල දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. මූලික සුදුසුකම්:

අයදුම්පත් කැඳවීමේ දිනය වන විට සක්‍රිය සේවයේ නියුතු ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ තනතුරු දරන වෛද්‍යවරයෙකු වීම හෝ එම ශ්‍රේණියේ තනතුරු දරන දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම.

02. සේවා නියමයන් හා කොන්දේසි:

මෙම තනතුර සඳහා පත් කරනු ලබන වෛද්‍ය නිලධාරීන් පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් නොලබනු ඇත.

03. වැටුප් ක්‍රමය:

(අ) මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව SL-03-2016 වැටුප් බාණ්ඩයේ පියවර 1 (රු. 88,000 - 12 X 2700 - 120,400) අදාළ වේ.

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට මසකට රු.6,000/- ක් බැගින් වූ වෛද්‍ය පරිපාලන දීමනාවක් ගෙවනු ලැබේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය:

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටියක් මත පදනම්ව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් තුළින් පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයේ දී යොදා ගැනීමට නියමිත ලකුණු පරිපාටිය **ඇමුණුම** I ලෙස අමුණා ඇත.

05. අයදුම් කිරීමේ ක්‍රමය:

(අ) මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර. **2024.10.** 30 දින හෝ ඊට ප්‍රථම ආයතන ප්‍රධානීන් හෝ විමධ්‍යගත ඒකක/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් මඟින් **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10** යන ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන් පමණක්** එවිය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

(ඇ) තම අයදුම්පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට කිසිවෙකු අදහස් කරන්නේ නම්, අයදුම්පත් භාර ගන්නා අවසාන දින සිට සති 3ක් ඇතුළත මා වෙත දන්වා එසේ කිරීමට ඔහුට/ඇයට හැකිය.

06. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.10.11 දිනැති අංක 1883/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි සහ එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි විධිවිධාන, රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා පරිපාටික රීතීන්හි I වැනි කාණ්ඩයේ ඇතුළත් කොන්දේසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ඇතුළත් කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

07. මෙම නිවේදනයේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

08. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට මූලික සුදුසුකම් ඇගයීම සිදු කරන අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වී වැඩ භාර ගන්නා දිනය, පත්වීම් දිනය ලෙස සලකනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

වෛද්‍ය පී.ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.